# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

**THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION**
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


## පුවත්පත් නිවේදනය
## වෛද්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකබව බරපතල අර්බුදයක

ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය නිදහසින් පසු බරපතලම අර්බුදයකට මුහුණ දී ඇතිබව රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයේ විශ්වාසයයි. ශ්‍රී ලංකාවෙන් බිහිවන වෛද්‍යවරු දැණුම මෙන්ම හැකියාව අතින් ද ලෝකයේ කිසිම වෛද්‍යවරයෙකුට දෙවෙනි නොවන අතර, එක්සත් රාජධානිය,ඕස්ට්‍රේලියාව, ඇමරිකාව ආදී ඕනෑම රටක සේවය කිරීමට සුදුසුකම් සපුරා ඇතිබව එම රටවල විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් සේවය කරන ශ්‍රී ලංකික වෛද්‍යවරුන්ගෙන් පැහැදිලි වේ. මේ තත්ත්වය රටට ලැබී ඇත්තේ මෙතෙක් අප රටේ පැවති වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය නිසා බව අපේ හැඟීමයි.

නමුත් අද දවසේ දී පහත සඳහන් කරුණු නිසා එම තත්ත්වය බරපතලම අර්බුදයකට පත් වී ඇතිබව අපගේ හැඟීමයි.

1. ලෝකයේ සියලුම රටවල් තම වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහල නැංවීමට කටයුතු කරද්දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව Act 16, ( 45%)විභාගයේ ලකුණු තත්ත්වය පහලට ඇද දමමින් එම විභාගයේ ප්‍රමිතිය සම්බන්ධව ගටළු මතුකර ඇත.

2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව නොමඟ යවමින් සාවද්‍ය වාර්තා ඉදිරිපත් කරමින් කුරුණෑගල ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලක තම උපාධි පාඨමාලාව හැදෑරුබව පවසා සිටි ලියාපදිංචි වෛද්‍යවරු පිරිසකට, වෛද්‍ය උපාධිය ලබා දීමේ සූදානමක් පවතී.

3. අද වන විට රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අවශ්‍ය මහාචාර්ය ඒකක පිහිටුවා නැත. එයට අමතරව අවශ්‍ය කරන පහසුකම් හා ආචාර්යවරුන්ද සපයා නැත. ඒ නිසා සිසුන් ඉතා අසරණ තත්ත්වයකට පත් වී සිටින අතර මේ හරහා ඉදිරි සීමාවාසික පුහුණුව ආරම්භ කිරීම දැඩි අර්බුදයකට ලක් වී ඇත.

4. ශ්‍රී ලාංකික වෛද්‍ය පීඨවල තත්ත්වය මෙසේ වෙද්දී, නීති විරෝධී ලෙස පවත්වාගෙන යන "පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක්" දිගින් දිගටම පුවත්පත් නිවේදන පලකරමින් අහිංසක දෙමාපියන්ගේ මුදල් තවදුරටත් එකතු කරමින් පවතී. ඊට අමතරව රජයේ දේපලද, රජයේ වෛද්‍ය විද්‍යාලවල ආචාර්යවරුන්ද ඔවුන්ගේ සේවයට ලබාගන්නා බවට වහසිබස් පවසති.

අපි මේ සියලු කාරණා මේ රටේ සියලුම වෘත්තිකයන්ගේ සහ සමස්ථ ජනතාවගේ අවධානයට ඉදිරිපත්කරන අතර, මේ සම්බන්ධව ඉදිරියේ දී වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය වෛද්‍ය ක්ෂේත්‍රයේ සියලු විද්වත් ආයතන, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ සෞඛ්‍ය අමාත්‍යංශය සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය - 2011/08/02